# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2006/37 - 2017 පෙබරවාරි මස 15 වැනි බදාදා - 2017.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

''2006 අංක 1 දරන බලයලත් නියෝජිතයින් අනුමත කිරීම පිළිබඳ නියෝග'' යන සිරස්තලය යටතේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වන වගන්තිය සමග කියවිය යුතු එහි 212 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මේ නියෝග 2017 පෙබරවාරි මස 9 වැනි දින සිට බලපැවැත්වෙන අතර 2007 මාර්තු 05 දින අංක 1487/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග සහ 2011 ජුනි මස 30 වැනි දිනැති අංක 1712/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ඊට කරන ලද සංශෝධනය අවලංගු කරනු ලැබේ.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මේ නියෝග, 2006 අංක 1 දරන බලයලත් නියෝජිතයින් අනුමත කිරීම පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග යටතේ ලියාපදිංචි කරන ලද සියලුම බලයලත් නියෝජිතයින් පිළිබඳ ලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

3. මේ නියෝග යටතේ බලයලත් නියෝජිතයකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂිත යම් පුද්ගලයකු විසින්, එම කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි, ඒ සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත අයදුම් කළ යුතු ය.

4. යම් පුද්ගලයකු වයස අවුරුදු විසිඑක සම්පූර්ණ කර ඇත්නම් සහ ශ්‍රී ලංකාව තුළ වාසය කරන ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ නම් මිස සහ, එම පුද්ගලයා :-

   (අ) දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වූ ද, සහකාර කොමසාරිස් තනතුරෙහි එකී දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව අවුරුදු පහකට නොඅඩු සේවයක් ඇත්තා වූ ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයකු ලෙස සේවය කර ඇති පුද්ගලයකු වන්නේ නම් ; හෝ

   (ආ) සමාගම් (විගණන) නියෝග යටතේ විගණකවරයකු ලෙස ලියාපදිංචි වී සිටින පුද්ගලයකු නම් ; හෝ

   (ඇ) II වන පන්තියේ විගණන අධිකාරී ධූරයට පහළ නොවන ධූරයක ශ්‍රී ලංකා විගණන සේවයෙහි සාමාජිකයකු ව සිටියා වූ සහ තරඟ විභාගයක ප්‍රතිඵල මත එම සේවයට පත් කරනු ලැබුවා වූ ද පුද්ගලයකු වන්නේ නම් ; හෝ

1A - PG 3415 — 532 (2017/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ගණකාධිකාරි සේවයේ II වන පන්තියට පහළ නොවන තත්ත්වයක, රජයේ ගණකාධිකාරි සේවයේ සාමාජිකයකුව සිටියා වූ සහ තරඟ විභාගයක ප්‍රතිඵල මත එම සේවයට පත් කරනු ලැබුවා වූ පුද්ගලයකු වන්නේ නම් ; හෝ

(ඉ) ''(i) පහත සුදුසුකම් අතුරෙන් එක් සුදුසුකමක් ; සහ

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ විධායක I මට්ටමේ විභාගය/ගණකාධිකරණය සහ ව්‍යාපාර පිළිබඳ I මට්ටමේ සහතිකය/සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරි/සහතික ලත් බදු උපදේශක ;

(ආ) පිරිවැය කළමනාකරණ ගණකාධිකාරින්ගේ ආයතනයේ ව්‍යාපාර ගණකාධිකරණ පිළිබඳ සහතික පත්‍රය ;

(ඇ) සහතික ලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය සුදුසුකම් පදනම් මට්ටම ;

(ඈ) ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ ආයතනයේ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරින්ගේ කළමනාකරණ මට්ටමේ (03)/අන්තර් මට්ටමේ සහතික පත්‍රය ;

(ඉ) ගණකාධිකරණ තාක්ෂණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ සාමාජිකත්වය දැරීම ;

(ii) සුදුසුකම් ලැබීමෙන් පසුව, ගිණුම් පිළිබඳව යටත් පිරිසෙයින් වසර දහයක පළපුරුද්දක් ඇති පුද්ගලයකු හෝ වන්නේ නම්, (ස්වයං රැකියාවක නියුතු නොවන) මිස ඒ පුද්ගලයාට බලය ලත් නියෝජිතයකු ලෙස ලියාපදිංචි වීමට හෝ බලයලත් නියෝජිතයන්ගේ ලේඛනයෙහි නම ඇතුළත් කරවා ගැනීමට හෝ හිමිකමක් නොමැත්තේ ය.''.

5. යම් පුද්ගලයකු,

(අ) සිහි විකල පුද්ගලයකු බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) වස්තු භංගත්වයට පත් වූ පුද්ගලයකු හෝ බංකොලොත් වූවකු වශයෙන් තීරණය කරන ලදුව, ඔහුගේ වස්තු භංගත්වය හෝ බංකොලොත් භාවය මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් නොවැළැක්විය හැකි අලාභ හෝ ආපදා හේතුවෙන් උද්ගතව ඇති බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් සහතිකයක් ලබා දී නොමැත්තේ නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ දී හෝ වෙනත් ස්ථානයක දී චරිත දූෂණය හා සම්බන්ධ වරදකට නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කර ඇත්නම් ; හෝ

(ඈ) වෘත්තීය විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරුවකු වී ඇත්නම් ; හෝ

(ඉ) මේ නියෝග යටතේ අනුමත බලයලත් නියෝජිතයකු නොවන යම් සේවා යෝජකයකු (විගණන සමාගමක් හැර) යටතේ රැකියාවක් භාරගෙන දේශීය ආදායම් පනතේ කාර්යයන් සඳහා බලයලත් නියෝජිතයෙකු ලෙස ව්‍යාපාරයක් කරගෙන යන්නේ නම් ;

ඒ පුද්ගලයාට බලය ලත් නියෝජිතයකු වශයෙන් ලියාපදිංචි වීමට හෝ එලෙස ලේඛනයේ තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හිමිකමක් නොමැත්තේ ය.

6. ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන යම් පුද්ගලයකු මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීමට හිමිකම් ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් එම පුද්ගලයා ලියාපදිංචි කොට, ඔහුගේ ලියාපදිංචිය සහතික කොට එම පුද්ගලයාට ලිපියක් නිකුත් කළ යුතු ය. ඔහුගේ නම කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයෙන් ඉවත් කරනු ලැබීමක දී එම ලිපිය ආපසු ලබාගත යුතු ය.

7. යම් පුද්ගලයකු,

(අ) තමාගේ නම ඉවත් කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කර ඇත්නම් ;

(ආ) 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් අශක්නුතා කිසිවකට පාත්‍ර වී ඇත්නම් ;

(ඇ) ඒ පුද්ගලයා විසින් ඔහුගේ වෘත්තියේ තත්ත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක්, නොසැලකිලිමත් කමක් හෝ වංක භාවයක් හෝ විෂමාචාරයක් හේතුකොට ගෙන, ඒ පුද්ගලයාගේ නම ලේඛනයෙන් ඉවත් කළ යුතු යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් සිය අනුමතය ඉවත් කොට, ඒ පුද්ගලයාගේ නම බලයලත් නියෝජිතයන්ගේ ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

8. කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති බලයලත් නියෝජිතයන්ගේ ලැයිස්තුවක් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක්වත්, ඒ වර්ෂයේ මාර්තු 31 වන දින ඉකුත් වීමට පෙර ගැසට් පත්‍රයේ පළ කරවිය යුතු ය.

03 - 125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.